සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

# 50 - නාට්‍ය හා රංග කලාව

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

Download all Past Papers>  https://bookbeekid.com/resource/past-papers/

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

## 50 - නාට්‍ය හා රංග කලාව

### ලකුණු බෙදීයාම

**I පත්‍රය**

**ලකුණු 1 X 40 = 40 කි.**

**II පත්‍රය**

II පත්‍රය ප්‍රශ්න 07 කි. 01 වන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. ඉතිරි ප්‍රශ්න 06 යෙන් 04 ක් තෝරා ගෙන පිළිතුරු සැපයිය යුතු ය.

01 ප්‍රශ්නයට ලකුණු 12 කි.

* තෝරාගන්නා ඉතිරි ප්‍රශ්න 04 කට ලකුණු 12 X 04 = 48 කි.

01 ප්‍රශ්නයට ලකුණු 12 කි.

02 ප්‍රශ්නයට ලකුණු 12 කි.
03 ප්‍රශ්නයට ලකුණු 12 කි.
04 ප්‍රශ්නයට ලකුණු 12 කි.
05 ප්‍රශ්නයට ලකුණු 12 කි.
06 ප්‍රශ්නයට ලකුණු 12 කි.
07 ප්‍රශ්නයට ලකුණු 12 කි.

} ඕනෑ ම ප්‍රශ්න 04 ට ලකුණු 48 කි.

| | |
|---|---|
| I පත්‍රයට ලකුණු | 40 |
| II පත්‍රයට ලකුණු | 60 |
| **මුළු ලකුණු** | **100** |



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතු වේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................
............................................
............................................ √ △ $\frac{4}{5}$

(ii) ............................................
............................................
............................................ √ △ $\frac{3}{5}$

(iii) ............................................
............................................
............................................ √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර ✗ ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද ලියන්න. අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු අදාළ තීරුවේ ඇතුළත් කළ යුතු ය.

| | |
|---|---|
| **සැ.යු :-** | **සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස I වන පත්‍රය II වන පත්‍රය හෝ III වන පත්‍රය තීරුවේ ඇතුළත් කළ යුතු ය. කිසිඳු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.** |

***



Download all Past Papers - https://bookbeekid.com/resource/past-papers/

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

# 50 - නාට්‍ය හා රංග කලාව

## I පත්‍රය - අභිමතාර්ථ

නිපුණතාපාදක විෂය මාලාව අනුව සියලු ම නිපුණතා ආවරණය වන සේ ප්‍රශ්න අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න සකසා ඇත. එය පහත සඳහන් පරිදි වේ.

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සිවුවන හා පස්වන නිපුණතා ආවරණය වන පරිදි ද,
- ප්‍රශ්න අංක 06 සිට 15 දක්වා ප්‍රශ්න පළමුවන, දෙවන, තෙවන හා සිවුවන නිපුණතා ආවරණය වන පරිදි ද,
- ප්‍රශ්න අංක 16 සිට 18 තෙක් ප්‍රශ්න සිවුවන නිපුණතාව ආවරණ වන පරිදි ද,
- ප්‍රශ්න අංක 19 සිට 26 දක්වා ප්‍රශ්න හතරවන නිපුණතාව ආවරණය වන පරිදි ද,
- ප්‍රශ්න අංක 27 සිට 40 දක්වා ප්‍රශ්න පළමු වන, දෙවන හා තෙවන හා සිවුවන නිපුණතා ආවරණය වන පරිදි ද, සකස්කර ඇත.

## I පත්‍රය ලකුණු කිරීම සඳහා උපදෙස්

- ප්‍රශ්න සංඛ්‍යාව 40 කි.
- එක් එක් ප්‍රශ්නයේ ඇති (1),(2),(3),(4) වරණ 4 අතුරින් නිවැරදි හෝ වඩාත් උචිත හෝ පිළිතුරේ අංකයට සැසඳෙන කවය (x) සලකුණු කර ඇත්නම් 01 ලකුණක් දෙන්න.
- එක් වරණයකට 01 බැගින් ප්‍රශ්න 40ට ලැබෙන මුළු ලකුණු සංඛ්‍යාව
  (01 x 40) = **40** කි.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

## II පත්‍රය - අභිමතාර්ථ

- ❖ ප්‍රශ්න අංක 01 අදාළ නිර්දිෂ්ට නාට්‍ය පෙළ ඇසුරෙන් සකස් කර ඇත. එය කොටස් හයකින් සමන්විත වේ. දැනුම, ආකල්ප සහ කුශලතා මැනෙන පරිදි ප්‍රශ්නයේ කඳට අදාළ ව මෙම අනුකොටස් සකස් කර ඇත.
- ❖ පළමුවැනි හා සිවුවැනි නිපුණතාව ආවරණය වන පරිදි කොටස් තුනකින් සමන්විත වන ලෙසින් 02 ප්‍රශ්නය ගොඩනැගී ඇත.
- ❖ ප්‍රශ්න අංක 03 සකස් කර ඇත්තේ පළමුවන නිපුණතාව ඇසුරෙන් කොටස් තුනකින් සමන්විත ලෙසිනි.
- ❖ සිවුවන නිපුණතාවට අදාළ ලෙසින් 04 ප්‍රශ්න සකස් කර ඇති අතර එය ද කොටස් තුනකින් සමන්විත වේ.
- ❖ පළමුවන හා තෙවන නිපුණතා ආවරණය වන පරිදි 05 වන ප්‍රශ්නය සකස් කර ඇත. මෙය ද කොටස් තුනකින් යුක්ත වේ.
- ❖ 06 වන ප්‍රශ්න සකස් කර ඇත්තේ පළමුවන හා දෙවන නිපුණතාව ආවරණය වන පරිදි කොටස් තුනකින් යුක්ත වේ.
- ❖ ප්‍රශ්න අංක 07 සකස් කර ඇත්තේ සියලු ම නිපුණතාවන් ගෙන් ලබාගත් කුශලතා මැනෙන පරිදි නාට්‍ය පෙළ රචනය මගින් ශිෂ්‍යයා ගේ පරිකල්පනය හා නිර්මාණශීලි රචනා හැකියාව මැනීම අපේක්ෂාවෙනි.

එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් ප්‍රශ්න 05 කට හිමි ලකුණු 12 x 5 = 60

## II පත්‍රය ලකුණු කිරීම සඳහා උපදෙස්

ප්‍රශ්න 07 කින් යුක්ත ය. එයින් පළමු වැනි ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර අනෙක් ප්‍රශ්න 06 න් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ.

- ❖ පළමුවැනි ප්‍රශ්නය කොටස් 06 කින් යුක්ත ය.
- ❖ දෙවන ප්‍රශ්නයේ සිට හය වන ප්‍රශ්නය දක්වා (I),(II),(III) වශයෙන් කොටස් 03 කින් යුක්ත ය.
- ❖ එක් එක් කොටසට හිමි ලකුණු සංඛ්‍යාව ප්‍රශ්නය අනුව වෙනස් වන අතර, ප්‍රශ්නයකට හිමි සම්පූර්ණ ලකුණු සංඛ්‍යාව 12 කි.
- ❖ ප්‍රශ්නයකට එක් එක් කොටස සඳහා වෙන් කොට ඇති ලකුණු සංඛ්‍යාව සැලකිල්ලට ගෙන අපේක්ෂකයා සපයා ඇති පිළිතුරට අනුව ලකුණු සංඛ්‍යාව තීරණය කළ යුතු ය.
- ❖ සම්පූර්ණ ලකුණු පිරිනැමීම සඳහා පිළිතුරට අපේක්ෂිත කරුණු සියල්ල ම ඇතුළත් විය යුතු ය.
- ❖ පිළිතුරු සංඛ්‍යාව 05කට වැඩියෙන් ලියා ඇති කල්හි අමතර පිළිතුරුවලින් ලකුණු අඩුවෙන් ලබා ඇති පිළිතුරු ඉවත් කිරීම සුදුසු ය.
- ❖ හත්වන ප්‍රශ්නය ඇගයීමට ලක් කිරීමේ දී අංග තුනකට අදාළ ව සලකා ලකුණු කිරීම කළ යුතු ය.


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**50 | S | I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்**
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

**නාට්‍ය හා රංග කලාව I, II**
**நாடகமும் அரங்கியலும் I, II**
**Drama and Theatre I, II**

**2018.12.11 / 1300 - 1610**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## නාට්‍ය හා රංග කලාව I

**සැලකිය යුතුයි :**

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

● පහත දැක්වෙන කවි, සිංදු හා ගීත ආශ්‍රයෙන් අංක 1 සිට 4 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) දෙමව්පියන් වැඳ අවසර අරගෙ ත
බත බුලතින් රස බොජුන් කවා ගෙ න
පව් පින් අරවා උන්නේ වෙන වෙ න
සිංහල දේසෙට එන්නට නික්මු න

(ii) මම වගේ පේඩි කතෙක් මනා
දුටුවා ද ලොවේ රුසිරෙන් දිනා
මව්පියො නිදහස් වෙන්න වා
මාව දුන්නයි නාකි වූ හමෙකු වා

(iii) ගෙදර ගොහින් මක් කරම් ද?
දීග තලක කොහොම යන්නෙ
ගෙදර තමයි ඉන්න වෙන්නෙ
පාරෙ බැහැල කොහොම යන්නෙ

(iv) ඇන්නැවෙ මේ මල කෝලම්
පාරෙ යන්නට බැහැ මුන්දෑ සමගින්
මව්පියෝ නිදහස් වෙන්න සිතා බැඳ
දුන්නේ ය මා මේ අඟුටුමිටියටා //

1. නූතන නාට්‍යයකට අයත් ගීතයක් වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

2. ශ්‍රී ලංකාවේ පැරණි ගැමි නාටකයකට අයත් කවියක් වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

3. නාඩගම් සම්ප්‍රදායට අයත් නාට්‍යයක සිංදුවක් වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

4. කෝලම් චරිතයක් විසින් ගැයෙන කවියක් වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

5. නෘත්ත යනු,
   (1) අංග වික්ෂේප භාවිත කරන භාවයක් දැක්වෙන නැටුමකි.
   (2) අංග වික්ෂේප භාවිත කරන අර්ථයක් සහිත නැටුමකි.
   (3) අංග වික්ෂේප භාවිත කරන රිද්මයානුකූල නැටුමකි.
   (4) අංග වික්ෂේප සහිත ශෝභමාන දෘශ්‍ය රූපයකි.

6. ප්‍රාසංගික කලාව යනු,
   (1) සංගීතය, නර්තනය, චිත්‍ර හා සැරසිලි කලාවන් ගේ එකතුවෙන් බිහි වන දෘශ්‍ය කලාවකි.
   (2) ප්‍රේක්ෂක පිරිසක් අභිමුඛයෙහි ඉදිරිපත් කැරෙන සජීවී කලාවකි.
   (3) නළු නිළියන් විසින් රූපවාහිනී මාධ්‍යයෙන් ඉදිරිපත් කරන නර්තන ප්‍රසංගයකි.
   (4) රූපවාහිනී රියැලිටි වැඩසටහන් මගින් ඉදිරිපත් කරනු ලබන සංගීත හා නර්තන ප්‍රසංගයකි.

7. නාට්‍යයක මූලික ලක්ෂණයක් වන්නේ,
   (1) නර්තනය සමග සංගීතය භාවිතයට ගැනීම ය.
   (2) මිනිස් ක්‍රියාවන් අනුකරණය කර දැක්වීම ය.
   (3) ජීවමාන සංගීතය භාවිතයට ගැනීම ය.
   (4) රංගභූමි අලංකරණය සඳහා පසුතල යොදාගැනීම ය.

8. නාට්‍ය කලාව අනෙකුත් කලාවන් ගෙන් වෙනස් වන්නේ,
   (1) රංගාලෝකය සහ පසුතල දර්ශන යොදාගන්නා බැවිනි.
   (2) රංගාලෝකය සහ ගගනිකාව යොදාගන්නා බැවිනි.
   (3) පසුතල දර්ශන සඳහා චිත්‍ර වස්ත්‍ර යොදාගන්නා බැවිනි.
   (4) සතර අභිනය රංගනය සඳහා යොදාගන්නා බැවිනි.

9. රූපණය සඳහා මූලික වශයෙන් අවශ්‍ය වන්නේ,
   (1) අනුකරණය, අනුරූපණය සහ රංග ක්‍රීඩාවයි.
   (2) අනුකරණය, අනුරූපණය සහ අංග රචනයයි.
   (3) අනුකරණය, අනුරූපණය සහ සමාරෝපයයි.
   (4) අනුකරණය, අනුරූපණය සහ රංගාලෝකයයි.

10. රංග ක්‍රීඩාවන්හි අරමුණ වන්නේ,
   (1) ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව දියුණු කිරීම ය.
   (2) ක්‍රීඩා කෞශල්‍යය දියුණු කිරීම ය.
   (3) හඬ උච්චාරණ හැකියාව දියුණු කිරීම ය.
   (4) පෙළ රචනා කිරීමේ හැකියාව දියුණු කිරීම ය.

11. ක්ෂණික නිරූපණ මගින්,
   (1) කථන හැකියාව දියුණු කරගත හැකි ය.
   (2) අභිරූපණ හැකියාව දියුණු කරගත හැකි ය.
   (3) පරිකල්පන හැකියාව දියුණු කරගත හැකි ය.
   (4) සංවේදන හැකියාව දියුණු කරගත හැකි ය.

12. නළුවරණය මගින් සිදු කළ යුත්තේ,
   (1) ජනප්‍රිය නළු-නිළියන් ම තෝරාගැනීමයි.
   (2) හිතවත්කම අනුව නළු-නිළියන් තෝරාගැනීමයි.
   (3) ගායන හැකියාව ඇති අය පමණක් ම තෝරාගැනීමයි.
   (4) ඒ ඒ චරිතයට ගැළපෙන අය පමණක් තෝරාගැනීමයි.

13. අංග රචනය සඳහා භාවිත කෙරෙන ද්‍රව්‍යයක් වන්නේ,
   (1) බයින්ඩර් ගම් ය. (2) ප්ලැටිග්නම් ය. (3) බ්‍රිස්ටල් බෝඩ් ය. (4) ක්‍රේප් හෙයා(ර්) ය.


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

● පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| මුල් කෘතිය | රචකයාගේ නම | පරිවර්තිත කෘතියේ නම | පරිවර්තකයා |
|---|---|---|---|
| කොකේසියන් චෝක්-සර්කල් | ක | හුණුවටයේ කතාව | හෙන්රි ජයසේන |
| ග | ඇන්ටන් චෙකොව් | චෙරිවත්ත | මැන්දිස් රෝහණධීර |
| ඩෝල්ස් හවුස් | හෙන්රික් ඉබ්සන් | ජ | සුනිල් විජේසිරිවර්ධන |

14. ඉහත වගුවේ 'ක' කොටුවට ඇතුළත් විය යුතු විදේශීය නාට්‍යකරුවා ගේ නම කුමක් ද?
(1) ෂෝන් පෝල් සාත්‍රෙ (2) ටෙනසි විලියම්ස් (3) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් (4) මැක්සිම් ගෝර්කි

15. ඉහත වගුවේ 'ග' කොටුවට ඇතුළත් විය යුතු විදේශීය මුල් නාට්‍ය කෘතියේ නම කුමක් ද?
(1) ද ෆාදර් (2) චෙරි ඕර්චාර්ඩ් (3) ද ඩැගන් (4) ද පබ්ලික් එනිමි

16. ඉහත වගුවේ 'ජ' කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තිත නාට්‍යයේ නම කුමක් ද?
(1) වෙස් මුහුණු (2) හිරු නැති ලොව (3) බෝනික්කි ගෙදර (4) ජන හතුරා

17. දික්තල කාලගෝල නාට්‍යයේ චරිතවලට වේශභූෂණ නිර්මාණය කළ යුත්තේ,
(1) ජාතක කතාවල සඳහන් වන විස්තරවලට අනුව ය.
(2) ලෝකධර්මී රංග ශෛලියට අනුව ය.
(3) නූර්ති රංග ශෛලියට අනුව ය.
(4) නාට්‍යධර්මී රංග ශෛලියට අනුව ය.

18. අභිරූපණ රංගනයක් සඳහා,
(1) ඕනෑ ම සිදුවීමක් යොදාගත හැකි ය.
(2) ඕනෑ ම අවස්ථාවක් යොදාගත හැකි ය.
(3) වාචික අභිනය ද යොදාගත හැකි ය.
(4) නරඹන්නාට මවාගත හැකි සිදුවීමක් නිරූපණය කළ යුතු ය.

19. නාට්‍යෝපකරණ,
(1) නළුවන් අත දරා සිටින දේවලට පමණක් සීමා වේ.
(2) වේදිකා පරිපාලක ගේ අභිමතය අනුව සකස් වේ.
(3) සෑම ශෛලියකට ම අයත් නාට්‍යවල දැකිය හැකි ය.
(4) නාට්‍ය පෙළ හෝ ශෛලියට අනුව සකස් වේ.

20. සිරුර සම්බන්ධ සංවේදන අභ්‍යාස මගින්,
(1) යමක් ආවර්ජනය කොට එය කුමක් දැයි පැවැසිය හැකි ය.
(2) යමක් ස්පර්ශ කොට එය කුමක් දැයි අවබෝධ කරගත හැකි ය.
(3) යමක් ආඝ්‍රාණය කොට එය තිබෙන තැන හඳුනාගත හැකි ය.
(4) යමක් රස බලා එය කුමක් දැයි පැවසිය හැකි ය.

21. නාට්‍යයකට සංගීතය අවශ්‍ය වන්නේ,
(1) ජවනිකා වෙනස්වීම ප්‍රේක්ෂකයන්ට හැඟවීම සඳහා ය.
(2) සංවාද අතරතුර ඇති නිහඬ බව නැති කර ගැනීම සඳහා ය.
(3) සිදුවීම් හා අවස්ථා උද්දීපනය කිරීම සඳහා ය.
(4) කතාවේ ඒකාකාරී ගලායාම මග හරවාගැනීම සඳහා ය.

22. රංග භූමියක තිබිය යුතු මූලික අවශ්‍යතාවක් වන්නේ,
(1) පසුතල ඉදිකිරීම සඳහා ප්‍රමාණවත් අවකාශයක් තිබීම ය.
(2) සමතලා භූමියක් හා ප්‍රමාණවත් අවකාශයක් තිබීම ය.
(3) සංගීත ශිල්පීන් සඳහා විශේෂ ස්ථානයක් තිබීම ය.
(4) නාට්‍යෝපකරණ තැන්පත් කිරීමට ප්‍රමාණවත් අවකාශයක් තිබීම ය.




Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

● පහත දැක්වෙන ඡායාරූප ආශ්‍රයෙන් **23** සිට **26** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


ක


ග


ජ


ච

**23.** 'තාරාවෝ ඉගිලෙති' නාට්‍යයට රංගනයෙන් දායක වූයේ කවුද?
(1) ක (2) ග (3) ජ (4) ච

**24.** 'හුණුවටයේ කතාව' නාට්‍යයෙහි ගායනයට හා රංගනයට දායක වූයේ කවුද?
(1) ක (2) ග (3) ජ (4) ච

**25.** කැලණි පාලම, ධවල භීෂණ හා ට්‍රෝජන් කාන්තාවෝ යන නාට්‍යවල රංගනයෙහි යෙදුණේ කවුද?
(1) ක (2) ග (3) ජ (4) ච

**26.** 'ජ' ඡායාරූපයෙන් දැක්වෙන නිළිය රඟ පෑ නාට්‍යයක් වන්නේ,
(1) 'ගුරුතරුව' ය. (2) 'විකෘති' ය. (3) 'තලමල පිපිලා' ය. (4) 'දික්තල කාලගෝල' ය.

**27.** නාට්‍යමය අවස්ථාවක් යනු,
(1) යම්කිසි කතා පුවතක් ඒ අයුරින් ම නිරූපණය කිරීමයි.
(2) යම්කිසි කතා පුවතක් රසවත් ව නිරූපණය කිරීමයි.
(3) සමාන අදහස් ඇති චරිතවල හැඟීම් නිරූපණය කිරීමයි.
(4) යම්කිසි ගැටුමක් සහිත සිද්ධියක් නිරූපණය කිරීමයි.

**28.** කෙටි නාට්‍යයක් යනු බොහෝ විට,
(1) දිගු නාට්‍යයක ජවනිකා කෙටි කර පෙන්වීමකි.
(2) දිගු නාට්‍යයක ජවනිකා අඩු කර පෙන්වීමකි.
(3) ඒකාංක නාට්‍යයකි.
(4) චරිත දෙකක් පමණක් ඇති නාට්‍යයකි.

**29.** විජය නන්දසිරි වඩාත් ප්‍රකට වූයේ,
(1) කෙටි නාට්‍ය රංගනය සඳහා ය. (2) හාස්‍ය රංගනය සඳහා ය.
(3) දුෂ්ට චරිත නිරූපණය සඳහා ය. (4) චිත්‍රපට අධ්‍යක්ෂණය සඳහා ය.

**30.** රාත්‍රි කාලයේ සොහොන් භූමියක හොල්මන් දර්ශනයක් මැවීමට උපකාර වන්නේ,
(1) ධාරාලෝක පහන් ය. (2) යොමු පහන් ය.
(3) විවිධ වර්ණ පහන් ය. (4) අල්ට්‍රාවයලට් පහන් ය.

**31.** පින්තූර රාමු වේදිකාවක් මනඃකල්පිත ලෙස බොහෝ විට බෙදා දක්වනු ලබන්නේ,
(1) කොටස් හතරකට ය. (2) කොටස් හයකට ය.
(3) කොටස් නවයකට ය. (4) කොටස් දොළහකට ය.

**32.** නාට්‍යයක් රඟ දැක්වෙන මොහොතේ දී එහි සාර්ථකත්වයට අනිවාර්යයෙන් ම සිටිය යුත්තේ,
(1) නාට්‍ය පෙළ රචකයා ය. (2) නාට්‍ය සංවිධායකවරයා ය.
(3) නාට්‍ය ශාලා භාරකරු ය. (4) ප්‍රේක්ෂකයෝ ය.

**33.** නාට්‍ය අධ්‍යක්ෂවරයා ගේ ප්‍රධාන කාර්යයක් වන්නේ,
(1) නාට්‍ය පෙන්වීම සඳහා ප්‍රවේශ පත්‍ර අලෙවි කිරීමයි.
(2) නාට්‍ය පෙළ පදනම් කරගෙන නළු-නිළියන් පුහුණු කරවීමයි.
(3) නාට්‍යයට අවශ්‍ය නාට්‍යෝපකරණ හා වේෂභූෂණ සැකසීමයි.
(4) නාට්‍යයට අවශ්‍ය සංගීතය පුහුණු කරවීමයි.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**34.** පහතරට සම්ප්‍රදායට අයත් ශාන්තිකර්මයක් වන්නේ,
(1) කොහොඹා කංකාරිය ය.
(2) සන්නි යකුම ය.
(3) වලියක් මංගල්‍යය ය.
(4) පහන් මඩුව ය.

**35.** පත්තිනි පූජාව මුල්කොට ගෙන රඟ දැක් වුණු ගැමි නාට්‍යය කුමක් ද?
(1) කෝලම්
(2) පාස්කු
(3) නාඩගම්
(4) සොකරි

**36.** නාඩගම් සම්ප්‍රදායට ආභාසය ලැබුණේ,
(1) කාමන්කූත්තු මගිනි.
(2) තෙරුක්කූත්තු මගිනි.
(3) කථකලි මගිනි.
(4) කවි නාඩගම් මගිනි.

**37.** නූර්ති රචනා කළ නාට්‍යකරුවකු ලෙස සැලකෙන්නේ,
(1) ඩී. ක්‍රිස්තියන් පෙරේරා ය.
(2) පිලිප්පු සිඤ්ඤෝ ය.
(3) චාල්ස් ද ආබෲව් ය.
(4) චාල්ස් ඩයස් ය.

**38.** මිනර්වා නාට්‍ය සඳහා පුරෝගාමී වූ බී.ඒ.ඩබ්ලිව්. ජයමාන්නගේ නාට්‍ය ප්‍රධාන වශයෙන් සැලකෙන්නේ,
(1) අනුවර්තන නාට්‍ය වශයෙනි.
(2) පරිවර්තන නාට්‍ය වශයෙනි.
(3) ස්වතන්ත්‍ර නාට්‍ය වශයෙනි.
(4) අසම්මත නාට්‍ය වශයෙනි.

**39.** ජයලත් මනෝරත්න විසින් නිර්මාණය කරන ලද නාට්‍ය පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) සොක්‍රටීස්, ද්විත්ව, පුත්‍ර සමාගම, ගුරුතරුව
(2) මහගිරිදඹ, කලමල පිපිලා, අන්දරේලා, ගුරුතරුව
(3) රතුහැට්ටකාරි, කලමල පිපිලා, සොක්‍රටීස්, ද්විත්ව
(4) රතුහැට්ටකාරි, සොක්‍රටීස්, මෝදරමෝල, අන්දරේලා

**40.** විකෘති නාට්‍යය රචනා කිරීමේ අරමුණ වූයේ,
(1) වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් වීමට නොහැකි වන දරුවන් ගේ ඛේදවාචකය පිළිබිඹු කිරීම ය.
(2) දරුවන් විභාග සමත් වී දෙමාපියන් සතුටු කිරීමට ගන්නා උත්සාහය පිළිබිඹු කිරීම ය.
(3) වැඩිහිටියන්ගේ අපේක්ෂා ඉටු කිරීම සඳහා බාල පරපුර කැපවන ආකාරය පෙන්නුම් කිරීම ය.
(4) ශ්‍රී ලංකාවේ යෞවනයන් විඳින පීඩාව හඬ ගා කීමට නාට්‍ය මාධ්‍යය යොදාගැනීම ය.

* *



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

රහස්‍යයි

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
**අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018**
**க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2018**

විෂයය අංකය / பாட இலக்கம்: **50**　　විෂයය / பாடம்: **නාට්‍ය හා රංග කලාව**

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 03 | 11. | 03 | 21. | 03 | 31. | 03 |
| 02. | 01 | 12. | 04 | 22. | 02 | 32. | 04 |
| 03. | 04 | 13. | 04 | 23. | 02 | 33. | 02 |
| 04. | 02 | 14. | 03 | 24. | 01 | 34. | 02 |
| 05. | 03 | 15. | 02 | 25. | 04 | 35. | 04 |
| 06. | 02 | 16. | 03 | 26. | 04 | 36. | 02 |
| 07. | 02 | 17. | 04 | 27. | 04 | 37. | 04 |
| 08. | 04 | 18. | 04 | 28. | 03 | 38. | 03 |
| 09. | 03 | 19. | 04 | 29. | 02 | 39. | 02 |
| 10. | 01 | 20. | 02 | 30. | 04 | 40. | 04 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: $\frac{25}{40}$

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: $\frac{25}{40}$



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

# 50 - නාට්‍ය හා රංග කලාව

## II පත්‍රය - පිළිතුරු

| |
|---|
| 1. **දික්තල කාලගෝල** නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.<br>(i) දික්තල කාලගෝල නාට්‍යය රචනා කොට මුල්වරට නිෂ්පාදනය කරන ලද්දේ කවුරුන් විසින් ද?(ලකුණු 02 යි)<br>(ii) එම නාට්‍ය පිටපත සංශෝධනය කොට 1975 වසරේදී නිෂ්පාදනය කරන ලද්දේ කවුරුන් විසින් ද?(ලකුණු 02 යි)<br>(iii) මෙම නාට්‍යයේ පූර්වරංගය යටතේ ඉදිරිපත් කෙරෙන අංගය කුමක් ද? (ලකුණු 02 යි)<br>(iv) දික්තල, කාලගෝල යන දෙදෙනා එකිනෙකා සමග නොගැළපීමට හේතු වන කරුණු දෙකක් දක්වන්න. (ලකුණු 02 යි)<br>(v) දික්තල කාලගෝල නාට්‍යයේ සංවාදවල ඔබ දකින විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)<br>(vi) නාට්‍ය අවසානයේ දී කාලගෝල ගයන ගීතයේ අදහස කුමක් ද? (ලකුණු 02 යි) |

(i). චාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ

*(ලකුණු 02)*

(ii). පුනයසේන ගුණසිංහ මහතා

*(ලකුණු 02)*

(iii). බහුභූත කෝලමා

*(ලකුණු 02)*

(iv).

* දික්තලා සුරූපී කාන්තාවක වීමත්
  කාලගෝල විරූපී පුද්ගලයෙකු වීමත්
* වයස පරතරය
* කාලගෝල දික්තලාවට කැමති වුවත් දික්තලා කාලගෝලට අකැමැති වීම
* දෙමාපියන් ගේ වුවමනාවට කාලගෝලට දික්තලා සරණපාවා දීම

***වැනි සමාන අදහස් ඇත්නම්***

*(ලකුණු 02)*

(v).

* වියත් වහර හා ගැමි වහර මිශ්‍ර ව යොදා තිබීම
* කෙටි වැකිවලින් යුත් රචනා වී තිබීම
* හාස්‍ය රසය මැවෙන පරිදි වචන ගැළපීම
* චරිත නිරූපණයට ම ඉවහල් වන පරිදි රචනා වී තිබීම
* කථා විකාශයට තුඩු දෙන පරිදි රචනා කර තිබීම
* කාලානුකූල ව හා රිද්මයානුකූල ව උච්චාරණය පරිදි රචනා වී තිබීම

*(ලකුණු 02)*

(vi) තමාට ගැළපෙන බිරිඳක කොහේ හෝ සිටින බව අදහස් වේ.

*(ලකුණු 02)*

***(මුළු ලකුණු 2 x6 = 12)***



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

2. (i) චරිත නිරූපණයට උපකාර වන නළු සිරුරට සම්බන්ධ අභිනය දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) නාට්‍යවල දක්නට ලැබෙන චරිත වර්ග පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 04 යි)
(iii) චරිත නිරූපණයේ දී නළු-නිළියන් විසින් සැලකිල්ලට ගත යුතු කරුණු මොනවා දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(i). ආංගික අභිනය
සාත්ත්වික අභිනය

*(ලකුණු 02)*

(ii).

* මිනිස් චරිත, සත්ත්ව චරිත, අධිමානුෂීය චරිත (යක්ෂ, දේව, භූත), කාල්පනික චරිත
* අජීවී වස්තූන් (ගස්, ගල්, මල්, ගංගා, සුළඟ) ආදි
* රූපවාහිනී වැඩසටහන්වල දක්නට ලැබෙන කාටූන් චරිත(බෙන්ටෙන්)
* මිනිස් ගති ලක්ෂණ මුල් කරගත් චරිත (ආදරය, බව, කරුණාව)
* අමූර්ත සංකල්ප මුල් කරගන්නා චරිත (ධනය, මරණය, කුසල්-අකුසල්, පින්-පව්)
* අද්භූත චරිත (යෝධයෝ, සුරංගනාවියෝ, මායාකාරියෝ)
* ප්‍රධාන චරිත හා අප්‍රධාන චරිත
* ස්ථාවර පත්‍රයන් (බහුබූත කෝලමා, සෙල්ලම් ළමා)

*(චරිත වර්ග 04 ක් නම් කොට ඇත්නම් ලකුණු 02)*
*(නම් කොට විස්තර කොට ඇත්නම් ලකුණු 04 යි)*

(iii).

* පෙළ හොඳින් අධ්‍යයනය කිරීම
* චරිතය මැනවින් වටහාගැනීම
* චරිත ලක්ෂණ ඉස්මතුවන පරිදි සංවාද උච්චාරණය කිරීම
* නාට්‍යයේ ශෛලියට අනුව රූපණ කාර්යය සකසාගැනීම
* ක්‍රියාවට අවශ්‍ය පරිදි ප්‍රති ක්‍රියා දැක්වීම
* පැහැදිලි ව ඇසට ඇසෙන සේ වචන උච්චාරණය කිරීම
* අවශ්‍ය තැන විරාම තබමින් අර්ථය මතුවන සේ දෙබස් උච්චාරණය කිරීම
* නාට්‍යයේ යටි පෙළ අරුත් මතු වන පරිදි චරිත නිරූපණය කිරීම
* සෙසු චරිත පිළිබඳ අවබෝධය
* ප්‍රේක්ෂාගාරයට පැහැදිලි ව පෙනෙන පරිදි ආංගික හා සාත්ත්වික අභිනයන් භාවිත කිරීම
* ආනුෂංගික අංග පිළිබඳ සවිඥානිකව රංගනයෙහි යෙදීම

*(ලකුණු 06)*



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

| | |
|---|---|
| 3. (i) රංගාලෝකය සඳහා භාවිත කෙරෙන විදුලි පහන් වර්ග දෙකක් නම් කරන්න. | (ලකුණු 02 යි) |
| (ii) රංගාලෝකය සපයාගැනීමට අතීතයේ භාවිත කළ උපක්‍රම මොනවා දැයි සඳහන් කරන්න. | (ලකුණු 04 යි) |
| (iii) වේදිකා නාට්‍යයකට රංගාලෝකය අවශ්‍ය වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. | (ලකුණු 06 යි) |

(i).

* යොමු පහන් (Spot Light)
* ධාරා පහන් (Flood Light)
* ආලෝක බුබුලු වැට (Batten Light)
* අල්ට්‍රාවයලට් පහන් (Uitraviolet Light)
* ක්ෂණ පහන් (Strob Light)
* ස්ට්‍රිප් පහන් (Strip Light)

*(දෙකක් ලියා ඇත්නම් ලකුණු 02)*

(ii). ගිනිමැල පන්දම් හා විලක්කු, කොප්පරා පහන්, ගෑස් ලාම්පු, කිට්සන් ලාම්පු, පැට්‍රොමැක්ස් ලාම්පු, ලන්තෑරුම, පරාවර්තිත දර්පණ තල

*(කරුණු 04 ක් දක්වා ඇත්නම් ලකුණු 04)*

(iii).

* වේදිකාව මත දිගහැරෙන රංගය මනා ලෙස ප්‍රේක්ෂකයනට දර්ශනය වීම සඳහා
* රංගන අවස්ථා තීව්‍ර කිරීම සඳහා
* අවස්ථා හා සිදුවීම් මතු කර දැක්වීම සඳහා
  (උදා :- යුද්ධය, කෝලාහල)
* කාලය හැඟවීම සඳහා (දිවා, රාත්‍රී ආදී ලෙස)
* ස්ථානීය වෙනස හැඟවීමට
* නළු කාර්යය අවධාරණය කිරීම සඳහා
* වේදිකාවේ ගැඹුර දැක්වීම සඳහා
* වේදිකාවේ පසුතලය හෝ පසුබිම මැවීම සඳහා
* වේදිකාවේ ඇති පසුතලය මනා ලෙස පිළිබිඹු කිරීම සඳහා
* විචිත්‍රවත් ප්‍රේක්ෂාවක් මැවීම සඳහා

*(කරුණු 03 පැහැදිලි කර ඇත්නම් ලකුණු 06 ක් දෙන්න. කරුණු 06 ක් පමණක් ලියා ඇත්නම් ලකුණු 06 ක් දෙන්න.)*




Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**4.** (i) කෝලම් රඟ දැක්වුණ ප්‍රදේශ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) කෝලම් රංග භූමියක රූපසටහනක් ඇඳ ඊට අයත් කොටස් නම් කරන්න. (ලකුණු 04 යි)
(iii) සාම්ප්‍රදායික කෝලම් රංගයක චරිත ඉදිරිපත් කෙරෙන පිළිවෙළ සඳහන් කරන්න. (ලකුණු 06 යි)

(i) බෙන්තර, අම්බලන්ගොඩ, ඔලබොඩුව, මිරිස්ස, පොකුණුවිට, උඩුපිල, අළුත්ගම, කඹුරුගමුව

*(ලකුණු 02)*

(ii)




*(ලකුණු 04)*

(iii)

01. තොරතුරු කතා කරයා. කාරිය කරවන රාළ හෙවත් සබේ විදානෙ

<u>පූර්වරංගනය</u>

02. අණ බෙර කෝලම
03. නොංචි කෝලම
04. හේවා කෝලම
05. පොලිස් කෝලම
06. ආරච්චි කෝලම
07. පේඩිරාළ හෙවත් ජස කෝලම හෙවත් ලෙන්චිනා
08. මුලදි කෝලම

<u>අපරරංගනය</u>

09. රජු සහ බිසව

සත්ත්ව චරිත (ගොන්, කොටි, සිංහ, වලස් ............)
රාක්ෂ චරිත (ගුරුළු රාක්ෂ, නාග රාක්ෂ, මරු රාක්ෂ ...........)
අවසානයේ කෝලම් කථා රඟ දැක්වීම

*(පිළිවෙළින් ලියා ඇත්නම් ලකුණු 06 ක් දෙන්න)*

Download all Past Papers - https://bookbeekid.com/resources/past-papers/

| | |
|---|---|
| 5. (i) පූර්වරංගය යනු කුමක් ද? | (ලකුණු 02 යි) |
| (ii) නාඩගම්වල පූර්වරංගයේ දී කරළියට පිවිසෙන චරිත හතරක් නම් කරන්න. | (ලකුණු 04 යි) |
| (iii) නාඩගම් රඟ දැක්වීමට ආවේණික වූ ලක්ෂණ විස්තර කරන්න. | (ලකුණු 06 යි) |

(i) ප්‍රධාන රංගයට පෙර කෙරෙන සියලු කටයුතු පූර්වරංගය නම් වේ.

*(ලකුණු 02)*

(ii) 01. බහුබූතයා (කෝලමා, කෝනංගී)

02. සෙල්ලම් ළමා (සෙල්ලපිල්ලෙ)

03. බෙරකරුවෝ (බෙරකාරයෝ)

04. අනාගතවක්තෘ

05. හඬ දූතයෝ

06. දේශනවාදීහු

*(චරිත 04 ක් නම් කර ඇත්නම් ලකුණු 04)*

(iii)

* පස් ගොඩ කර තාවකාලික ව සකස් කරගත් රංග භූමිය කරළිය ලෙස භාවිත කිරීම
* පියස්සක් සහිත කරළියට යාබද මඩුවක් සකස් කර තිබීම
* පොතේගුරු සහ ගායක කණ්ඩායමක් යොදාගැනීම
* දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතය යොදාගැනීම
* සංගීත භාණ්ඩ ලෙස මද්දල දෙකක්, හොරණෑව, රවිකිඤ්කඳය භාවිත කිරීම
* පිරිමි පමණක් රංගනයේ යෙදීම
* පන්දම් ආලෝකය හා කිට්සන් පහන් භාවිතය
* රාත්‍රි කාලයේ රඟ දැක්වීම
* දින හතක් පුරා පූර්වරංගය පවත්වා පසු ව කොටස් වශයෙන් කථා පුවත රඟ දැක්වීම
* ඒ ඒ චරිතයට අදාළ ගමන් තාල (ගමන් විලාස) භාවිතා කිරීම
* ස්වාභාවික අමු ද්‍රව්‍ය භාවිතයෙන් අංග රචනා සඳහා වර්ණ සකස් කර ගැනීම

*(ඉහත කරුණු තුනක් ලියා විස්තර කර ඇත්නම් ලකුණු 06)*

*(කරුණු 06 ක් පමණක් ලියා ඇත්නම් ලකුණු 06 ක් දිය හැකි ය)*



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**6.** (i) වීදි නාට්‍ය යනු කුමක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)
(ii) විවෘත වීදි නාට්‍ය කණ්ඩායම විසින් රඟ දක්වන ලද වීදි නාට්‍ය හතරක නම් සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) ශ්‍රී ලංකාවේ වීදි නාට්‍ය කලාවේ පුරෝගාමියකු පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 06 යි)

(i) සම්මතවේදිකාවෙන් බැහැරව මහජනයා ගැවසෙන එළිමහන් ස්ථානයක නිදහස් රංග ශෛලියක් උපයෝගී කර ගෙන රඟ දක්වනු ලබන නාට්‍ය විශේෂයකි.

*(ලකුණු 02)*

(ii) බොසත් දැක්ම, රජ දැක්ම, පෝලීම, මිහෙකුට එල්ලිලා මැරෙන්න බැරිද?

රූකඩයෝ, ලෝක ආහාර සම්මේලනය

බීජ දැක්ම

පිං පෙට්ටිය

අපිත් අඳුනා ගන්න. රටත් අඳුනා ගන්න.

ඔංචිල්ලාව. වෙසක් දැක්ම. ජේසු දැක්ම.

උතුමාණෝ නැවත පැමිණේ, ග්‍රැම්මා නැව පැමිණේ

රංකුකුලෝ, පර්ෂින් කුරුල්ලා අපට එපා

නුරුස්සන හඬ

වෙන්දේසිය, පිබිදීම

එළඟ, මෝරනවා

මනමේ, ඔබ දුටුවා

නීතියේ කනහාව

කමිසය

මලට මල, විශ්වවිද්‍යාල දැක්ම

*(ලකුණු 04)*


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(iii) **<u>ආචාර්ය ගාමිණී හත්තොටුවේගම මහතා</u>**

ශ්‍රී ලංකාවේ වීදි නාට්‍ය කලාවේ පුරෝගාමියකු ලෙස ආචාර්ය ගාමිණී හත්තොටුවේගම මහතා කැපී පෙනේ. ඔහුගේ මූලිකත්වයෙන් වීදි නාට්‍ය රාශියක් නිෂ්පාදනය වී ඇත. එම නාට්‍ය මගින් කලඑළි බට නළු නිළියන් විශාල සංඛ්‍යාවක් වර්තමානයේදී වේදිකා නාට්‍ය චිත්‍රපට හා ටෙලි නාට්‍යවල රංගනයට එකතු වී ඇත. වීදි නාට්‍ය මෙන්ම සම්මත වේදිකාව සඳහා ද හත්තොටුවේගම මහතා සිංහල හා ඉංග්‍රීසි නාට්‍ය නිෂ්පාදනය කර ඇත.

1938 දී ගාල්ල රිච්මන්ඩ් කන්දේ නිවසේදී උපත ලද ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ගෞරව උපාධිධරයෙකි. පසුව කැලණිය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලවල ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ආචාර්යවරයෙකු ලෙස සේවය කළේය. විශ්වවිද්‍යාල සිසුන්ට ඉංග්‍රීසි භාෂාව මෙන්ම සිනමා විෂය ද නාට්‍ය හා රංග කලාව පිළිබඳ ප්‍රායෝගික අභ්‍යාස ද උගන්වමින් ඔහු කලා ක්ෂේත්‍රය පෝෂණය කිරීමට මහඟු මෙහෙයක් ඉටු කළේය. නාට්‍ය රචකයෙකු හා නිෂ්පාදකවරයෙකු ලෙස කටයුතු කළ හත්තොටුවේගම මහතා වීදි නාට්‍ය මගින් විශාල ශෝලයන් සංඛ්‍යාවක් මෙරට නාට්‍ය ක්ෂේත්‍රයට දායාද කළේය.

1974 වසරේ දී ලයනල් වෙන්ට්ව් රංග ශිල්ප ශාලිකාවේ සිසුන් සහභාගි කරවා ගෙන නාට්‍ය වැඩමුළු පැවත් වූ ඒ මහතා නාට්‍ය වැඩමුළුවලට සහභාගි වූ සිසු-සිසුවියන් යෙදවා ගෙන වීදි නාට්‍ය රාශියක් නිෂ්පාදනය කළේය. 1974 දී පොසොන් පොහෝය දින අනුරාධපුර දුම්රියපළේ දුම්රිය වේදිකාවක් මත රඟ දැක්වුණු ප්‍රථම වීදි නාට්‍ය දැක්ම ඉදිරිපත් කෙරුණේ හත් කොටුවේගම මහතාගේ පුරෝගාමීත්වයෙනි. මෙම වීදි නාට්‍ය දැක්ම මෙරට නාට්‍ය කලාවේ අලුත් අත් දැකීමක් විය. නවක හා ආධුනික රංගන ශිල්පීන් යොදවාගෙන පර්යේෂණාත්මක නව නාට්‍ය ආකෘති අත්හදා බැලූ ඒ මහතා සම්මත වේදිකාව සඳහා හැම්ලට් වැනි පරිවර්තන නිෂ්පාදනය කළේය. නිදහස් රංග ආකෘතියක් අනුව නිෂ්පාදිත ඔහුගේ වීදි නාට්‍ය මගින් කාලීන සමාජයේ දේශපාලන දැවෙන ප්‍රශ්න විවේචනාත්මක දෘෂ්ටි කෝණයකින් ඉදිරිපත් කෙරුණි.

*(ලකුණු 06)*


Download all Past Papers>> https://bookbeekid.com/resource/past-paper

7. පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කරගෙන නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කරගත හැකි ය.

සුනිල් කතාන්දර ගොතා කීමට දක්ෂ ළමයෙකි. නාට්‍ය තරගයක් සඳහා ඉදිරිපත් කිරීමට නාට්‍යයක් නිපදවීමට ඔහු සූදානම් වෙයි. සුනිල් ගේ පන්තියේ මිතුරකු වන නිමල් රඟපෑමට දක්ෂ දඟකාර ළමයෙකි. දෙදෙනා එකතු වී නාට්‍යය පුහුණුවීමට සූදානම් වන විට ඒ බව ආරංචි වී දඩබ්බර හැඩි දැඩි සිසුවකු වන ජූඩ් එතැනට පැමිණෙයි. ඔහු නාට්‍යයේ රජු ගේ චරිතය තමාට දිය යුතු බව කියාසිටියි.

(i) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමඟ සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04 යි)
(ii) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ලකුණු 04 යි)
(iii) දෙගිඩියාව, කුතුහලය, උත්ප්‍රාසය සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04 යි)

ප්‍රශ්නනයට අදාළව පසුබිම කාලය හා චරිත ගොඩ නගමින් රංග විධාන හා සංවාද සහිතව චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් දෙගිඩියාව, කුතුහලය, උත්ප්‍රාසය සහිතව නාට්‍යෝචිත අවස්ථා ගොඩ නගා තිබීම අපේක්ෂා කෙරේ.

ඒ අනුව

(i) රංග විධාන සහිත සංවාද ගොඩ නගා තිබීම

*(ලකුණු 04)*

(ii) චරිත අතර, ගැටුමක් ඇතිවන අයුරින් පෙළ සකස් කිරීම

*(ලකුණු 04)*

(iii) දෙගිඩියාව, කුතුහලය හා උත්ප්‍රාසය සහිතව නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කර තිබීම

*(ලකුණු 04)*

Download all Past Papers >. https://bookbeekid.com/resource/past-papers/

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/